# 2022 මැයි මස 24 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.05.24 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම්ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 09. ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 21. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 01. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 අප්‍රේල් මස 26 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 02හි මාගේ ප්‍රකාශයේ "ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම් වලට කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ඉඩම් ලබා දුන්නා "යනුවෙන් සංශෝධනය විය යුතුයි.

ගරු සභාපතිතුමා

වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේත් නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.04.26 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.04.26 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. මූල්‍ය ප්‍රකාශන විගණනය - 2021 හිඟ ශිට් ආදායම් පරීක්ෂාව පිළිබඳව විගණනාධිපති විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

02. ජාතික ඵලදායිතා සම්මාන 2020 වර්ෂයට අදාළව ජයග්‍රහණ ලබා ගත් ආයතන ඇගයීමේ උත්සවයක් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එහිදී පළාත් පාලන ආයතන අතර පැවති තරඟයෙන් තෙවන ස්ථානය ලබා ගත් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාව සම්මානයෙන් පිදුම් ලැබූ බව සතුටින් නිවේදනය කරමි.

ගරු සභාපතිතුමා

ජාතික ඵලදායිතා සම්මාන 2020 අදාළවපැවති තරඟයෙන් ජයග්‍රහණ ලබා ගත් මධ්‍යම පළාතේ රාජ්‍ය ආයතන ඇගයීමේ උත්සවයක් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එම තරඟයේ පළාත් පාලන ආයතන අතර පැවති තරඟයෙන් තෙවන ස්ථානය ලබා ගැනීම වෙනුවෙන් අප ප්‍රාදේශීය සභාව සම්මානයට පාත්‍රවූ බව සතුටින් දැන්වා සිටිනවා. අප ප්‍රාදේශීය සභාව මෙම ජයග්‍රහණය කරා ගෙන එන ගමනේදී අප සභාව මේ දක්වා ඉදිරියට ගෙන ඒමට දායකත්වය ලබා දුන් හිටපු ගරු ප්‍රාදේශීය සභා සභාපති දෙපල වන ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා සහ හිටපු ගරු ප්‍රාදේශීය සභා සභාපති ආර්.පී. ගුණරත්න මහතාට ස්තූතිවන්ත වෙනවා. එසේම අප ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු මාගේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මම ස්තූතිවන්ත වෙනවා.

03. රාජ්‍ය මුදල් ඉතා වගකීමෙන් සහ පිරිමැස්මෙන් යුතුව පරිහරණය කරමින් මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීමේ අවශ්‍යතාවය පෙන්වාදෙමින් රාජ්‍ය වියදම් පාලනය පිළිබඳව මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛය සභාගත කරමි.

## 03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

### 05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021.09.06 වන දින වැඩ කටයුතු ආරම්භ කර මේ වන විට අවසන් අදියරට ළඟාවී ඇති අසුපිණි ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු දැනට අවසන් අදියරටද පැමිණ ඇත. වර්තමානයේ වෙළඳපොළපවතින ද්‍රව්‍ය වල මිළ ඉහළ යාම හේතුවෙන් එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ගැනීමට නොහැකි වීම මත ව්‍යාපෘතියේ වැඩ නිම කර ගැනීමට නොහැකි වී ඇත. එම ව්‍යාපෘතියේ ඉදිරි සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා පවතින මිළ ගණන් වලටඅනුව බිල්පත් සකස් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අසුපිණි ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු දැනට අවසන් අදියරට පැමිණ ඇත. එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකිවී ඇති බව දන්වමින් පවතින මිළ ගණන් වලටඅනුව බිල්පත් සකස් කර දෙන මෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීමක් කර ඇත. වර්තමානයේ වෙළඳපොළපවතින ද්‍රව්‍ය වල මිළ ඉහළයාම මත බිල්පත් වෙනස් කිරීමට අප සභාවට බලයක් නෑ.එම නිසා මේ පිළිබඳව ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව මාගේ අදහසයි. එම නිසා මෙම ව්‍යාපෘතියේ ඉදිරි සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා පවතින මිළ ගණන් වලටඅනුව බිල්පත් සකස් කිරීම කළ හැකිද යන්න පිළිබඳව ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙන් විමසා එම නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළබඳව වෙනත් අදහසක් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, අසුපිනිඇල්ල නැරඹුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය දැනට ආරම්භ කර අවසන් අදියරට පැමිණි ව්‍යාපෘතියක් නිසා මිළ වෙනසක් කර හෝ නීත්‍යානුකූල ලෙස අපි සියලුදෙනා බේරෙන ආකාරයෙන් කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරන ව්‍යාපෘතියක් නිසා අපට මෙහි මිළ වෙනස් කිරීමක් කරන්න බෑ. එම දෙපාර්තමේන්තුවේ නීති අනුව 47/1 වගන්තිය අනුව මිළ වෙනස්වීම මත බිල්පත් වෙනස් කරන්න නොහැකි බව ඔවුන් පවසනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,අසුපිණි ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මේ දක්වා සංචාරක අමාත්‍යංශය මගින් මුදල් ප්‍රතිපාදන ලබා දුන්නා. ඵලදායී ව්‍යාපෘතියක් නිසා ඔවුන් අපට මුදල් ප්‍රතිපාදන ලබා දුන්නා. මෙම ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විටින් විට පැමිණ අධීක්ෂණය කළා. ඒ පිළිබඳව එම නිලධාරීන්ට ස්තූතිවන්ත වෙනවා. මෙම අවස්ථාවේ පවතින මිළ ගණන් වලට අනුව බිල්පත් සකස් කිරීමට හැකියාවක් ඇත්දැයි විමසා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව කටයුතු කිරීම සුදුසු බව මාගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය:-

අසුපිණි ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා ද්‍රව්‍ය වල පවතින මිළ ගණන් වලටඅනුව බිල්පත් සකස් කළ හැකිදැයි ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට තීරණය කරන ලදි.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව **(Bore Hole Test)** ලබාගැනීම සඳහා සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය**(Soil Tech (Pvt) Ltd)** මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක (රුඃ 585,000.00)මිල ගණනක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව එම ආයතනය මගින් මෙම පරීක්ෂණය සිදුකර අවසන් වූ අතර පරීක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී සිදුවූ මිළ ගණන් වෙනස්වීම් හේතුවෙන් එම ආයතනය මගින්

ඉදිරිපත් කරන ලද බිල්පත් වටිනාකම රුපියල් අටලක්ෂ පනස් හයදහස් තුන්සිය දෙකකි. (රුඃ 856,332.00) ඒ අනුව අදාළ ආයතනය මගින් පරීක්ෂණ වාර්තාව අප ආයතනය වෙත ලබාදීමට ප්‍රථම ඔවුන්ගේ බිල්පත් වටිනාකමින් අඩක් එනම් රුපියල් හාරලක්ෂ විසිඅටදහස් එකසිය හැට හයක ( රුඃ 428,166.00) මුදලක් ගෙවන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව රුඃ 428,166.00 ක මුදල සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත ගෙවීම් කර පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව **(Bore Hole Test)** ලබාගැනීම සඳහා සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය**(Soil Tech (Pvt) Ltd)** මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක (රුඃ 585,000.00)මිල ගණනක් ඉදිරිපත් කරන ලදි.ඒ අනුව එම ආයතනය මගින් මෙම පරීක්ෂණය සිදුකර අවසන් වූ අතර පරීක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී අදාළ පරීක්ෂණ කිරීමට කැණීම් කළ ගැඹුර වැඩි වීම මත මිළ ගණන් වෙනස්වීම් හේතුවෙන් එම ආයතනය මගින් රුපියල් අටලක්ෂ පනස් හයදහස් තුන්සිය දෙකක (රුඃ 856,332.00)බිල්පත් වටිනාකමක් ඉදිරිපත් කර ඇත. මෙවැනි විශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී පාංශු පරීක්ෂණය අවශ්‍යම කාරණයක් වන බැවින් මෙම මුදල ගෙවීමට සිදුව ඇත. අදාළ පාංශු පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට නම් ඔවුන්ගේ බිල්පත් වටිනාකමින් අඩක් එනම් රුපියල් හාරලක්ෂ විසිඅටදහස් එකසිය හැට හයක ( රුඃ 428,166.00) මුදලක් ගෙවන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව රුඃ 428,166.00 ක මුදල සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත ගෙවීම් කර පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඇතිනම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, මෙම ව්‍යාපෘතිය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත්. ගොඩනැගිල්ල ඉදිකිරීමට අත්තිවාරම යොදන්න කලින් එහි පසෙහි තත්ත්වය පරීක්ෂා කිරීම කළ යුතුයි. කෙසේ හෝ මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට පාංශු පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට මෙම මුදල ගෙවීම සුදුසුයි.

පෙ:වඃ 10.18ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. නිලාම් මහතා සභා ගර්භයට පැමිණෙන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි, දොළොස්බාගේ රෝහලේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමටද පාංශු පරීක්ෂණ වාර්තාව ලබා නොගැනීම නිසා එම ගොඩනැගිල්ල අදටත් වැඩ නිමකර ගැනීමට නොහැකිව එම ව්‍යාපෘතිය නැවතී තිබෙනවා. එම නිසා පාංශු පරීක්ෂණ වාර්තාව ලබා ගෙන නිවැරදි ක්‍රමයට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට අදාළව මූලික සැළසුම් යොදලා තිබෙන වෙලාවක පාංශු පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා. මෙම යොජනාව පිළිබඳව පසුගිය සභාවේදීද සාකච්ඡා කර මුදල් ගෙවීමට අනුමැතිය ලබා දුන්නා. මෙම මස වන විට එම මුදල වැඩිවී තිබෙනවා. කෙසේ නමුත් මුදල් කමිටු වාර්තාව සහ පසු ගිය සභා වාර්තාව දෙස

බලන විට මුදල් සම්බන්ධයෙන් පොඩි ගැටළුවක් ඇතිව තිබෙනවා. මෙම ව්‍යාපෘතියට මාගේ අකමැත්තක් නෑ. එහෙත් මේ සඳහා මුදල් ගෙවීමට මාගේ විරුද්ධත්වය මා ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, පාංශු පරීක්ෂණ වාර්තාව පාංශු පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට අවශ්‍ය නිසා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මුදල් ගෙවීම සිදු කළා. ඊට අදාළ අනුමැතිය තමයි අද මේ මහා සභාවෙන් බලාපොරොත්තු වෙන්නේ. පාංශු පරීක්ෂණ වාර්තාව ප්‍රමාද වනවිට ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වී තිබෙනවා. කැණීම් සිදු කිරීමට ඇති ප්‍රමාණය වැඩි වීම මතයි මිළ වෙනස් වෙලා තියෙන්නේ. එසේ නොමැතිව ඔබතුමා කියන විදිහට බොරුවක් කරලා නෑ. ඔබතුමා මෙම නගරය හදනවාට විරුද්ධත්වයක් දක්වන බවයි මෙයින් පෙනෙන්නේ. ඔබතුමාට යම් දෙයක් මේ පිළිබඳව දැන ගැනීමට අවශ්‍යනම් සභාවෙන් සියල්ල දැනගන්න පුළුවන්. තවද මෙම ආයතනය පමණයි මිල ගණන් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, විරුද්ධයි කියන වචනය මෙම යෝජනාවේදී ප්‍රකාශ කරනවාට මම කැමති නෑ. විපක්ෂයේ සිටියත් අපි මෙම යෝජනාවට විරුද්ධ නොවිය යුතුයි යන්න මාගේ මතයයි. පාංශු පරීක්ෂණය සිදු කිරීමේදී ගොඩනැගිල්ල ඉදිකිරීමට මෙම පොළොව සුදුසුද යන්න තීරණය කරනවා. අද රට තුළ පවතින මිළ ගණන් වෙනස් වීමත් මත මෙම මුදල ගෙවීම ප්‍රායෝගිකයි යන්න මාගේ මතයයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු මහා සභාවක් බවට පත් කරන ලදි.

ගරු සභාපතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්පී ආනන්ද කුලතිලක මහතා විරුද්ධ වීම නිසා මෙම යෝජනාවට ඡන්ද විමසීමක් සිදු කළ යුතුයි. මුලින්ම අත් ඔසවා පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ යුතු අතර දෙවනුව විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්න.

මෙම යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දීම

| | | |
|---|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - පක්ෂයි |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - පක්ෂයි |
| 03. ආර්..පී.ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 05. ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 07. ඩී.පී.පී. ඩබ්. පී. ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - පක්ෂයි |

| | | |
|---|---|---|
| 09. ඒ.ජී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 10. සුබෝධා ලක්ෂානි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 13. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 15. එම්.ජී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 16. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 17. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 18. එස්.ජී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 19. රාජකුමාර් විදූෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 20. එන්.එම්. නන්දාවතී නවරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 21. ආර්.ජී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි. |

<u>මෙම යෝජනාවට විපක්ෂව ඡන්දය ලබා දීම</u>

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - විපක්ෂයි

<u>අද දින නොපැමිණි අය:-</u>

01. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

<u>ගරු සභාපතිතුමා</u>

**මෙම යෝජනාව සඳහා පක්ෂව ඡන්ද 21ක්ද විපක්ෂව ඡන්ද 01 ක්ද ලැබී තිබෙනවා. ඒ අනුව මෙම යෝජනාව වැඩි ඡන්ද 20 කින් සම්මත වූ බව ප්‍රකාශ කරනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව පෙනීයනවා.**

<u>තීරණය:-</u>

**කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව (Bore Hole Test) ලබාගැනීම සඳහා සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය(Soil Tech (Pvt) Ltd) වෙත රු: 428,166.00 ක මුදල ගෙවීම් කර පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.**

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අප සභාව වෙත පවරා ගැනීමට අදාළව මැනුම් කටයුතු සිදු කළ යුතු පහත සඳහන් ඉඩම් මැන නිරවුල් කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ඉඩමේ නම | ප්‍රමාණය | ඉඩමේ නම |
|---|---|---|---|
| 01 | ඇපලවත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | ඇපලවත්ත සුසාන භූමිය |
| 02 | ඇපලවත්ත | පර්චස් 30 (දළ වශයෙන්) | ප්‍රජාශාලාව |
| 03 | ගෝනවත්ත | අක්කර 1 (දළ වශයෙන්) | ගැමුණුපුර සුවඳගල ක්‍රීඩාපිටිය |
| 04 | තැඹිලිගල වත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | තැඹිලිගල වත්ත ක්‍රීඩාපිටිය (සාර්ක්) |
| 05 | කුරුඳුවත්ත | පර්චස් 40 (දළ වශයෙන්) | පොදු වැසිකිළිය පිහිටි භූමිය හා සති පොල පිහිටි භූමිය |
| 06 | කුරුඳුවත්ත | අක්කර 1/2 (දළ වශයෙන්) | කුරුඳුවත්ත පුස්තකාලය |
| 07 | කුරුඳුවත්ත | අක්කර 1 1/4 (දළ වශයෙන්) | මල්වත්තගම සුසාන භූමිය |
| 08 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1 (දළ වශයෙන්) | මැදගොඩහන්දිය වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට |
| 09 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | උඩහේන්තැන්න ක්‍රේහෙඩ් සුසාන භූමිය (කහවත්ත වැව්ලි සමාගම) |
| 10 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2(දළ වශයෙන්) | හල්දොල සේවා පියස |
| 11 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2(දළ වශයෙන්) | අම්පිටිය ජන උදාන ප්‍රජාශාලාව |
| 12 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2(දළ වශයෙන්) | උඩහේන්තැන්න අඹ ගස් ලැයිම ක්‍රීඩාපිටිය |
| 13 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2(දළ වශයෙන්) | ක්‍රේහෙඩ් උඩ කොටස ක්‍රීඩාපිටිය |
| 14 | මල්ගොල්ල වත්ත | අක්කර 1/2(දළ වශයෙන්) | මල්ගොල්ල ප්‍රජාශාලාව |
| 15 | මල්ගොල්ල වත්ත | අක්කර 1(දළ වශයෙන්) | මල්ගොල්ල ක්‍රීඩාපිටිය |
| 16 | තැඹිලිගලවත්ත | | තැඹිලිගලවත්ත සුසාන භූමිය හා ශ්‍රීධරන්පුර සුසාන භූමිය |

( කොල්වින් මන්ත්‍රීතුමාගේ ඉඩම් සහ සභාවේ ඉඩමේ නම ඇතුළත් කරන්න)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අප සභාව වෙත පවරා ගැනීමට අදාළව මැනුම් කටයුතු සිදු කළ යුතු ඉහත සඳහන් ඉඩම් මැන නිරවුල් කර ගැනීම සුදුසු බවටත් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, අප ප්‍රාදේශීය සභාව අයත් ඉඩමද මෙම මැනුම් කටයුතු වලට ඇතුළත් කර ගැනීම සුදුසුයි. මෙ ඉඩම් මැන සභාවට අයත් ඉඩම් සඳහා ඔප්පු ලබා ගැනීම අපි කළ යුතුයි. පළාත් පාලන ආයතන ෂතු වත්කම් අපි රැකගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා

ගරු සභාපතිතුමනි, පරගල කොට්ඨාශයේ ඉඩම් කිහිපයක් මැනුම් කටයුතු කිරීමට ඉල්ලීම් කළා. ඒවාත් මෙයට ඇතුළත් වෙනවානම් හොඳයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, ප්‍රජා ශාලා වගේනම් සුභසාධක සමිති වල සල්ලි තියෙනවා. මැනුම් කටයුතු සඳහා එම සමිති වලින් මුදල් අයකරමු. අපිට සභාවක් වශයෙන් මෙතරම් වියදමක් දරණවාට වඩා එහෙම කරන්න පුළුවන් නම් හොඳයි.

ගරු සභාපතිතුමා

නාලක මන්ත්‍රීතුමා දැක්වූ ඒ අදහස ඉතා වටිනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව පෙනීයනවා.

තීරණයඃ-

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අප සභාව වෙත පවරා ගැනීමට අදාළව මැනුම් කටයුතු සිදු කළ යුතු ඉහත සඳහන් ඉඩම් මැන නිරවුල් කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව වර්තමානයේ රටෙහි පවතින වෙළඳපොළ මිළ විචලනය පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පවතින මිළ ගණන් අනුව ගෙවීම් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. එනමුත් ඒ සඳහා ප්‍රතිපාදන සළස්වා නොමැත. මේ වන විට රට තුළ පවතින වාතාවරණය අනුව මෙහි ඉදිකිරීම් සඳහා ඉල්ලා ඇති දේශීය ණය මුදල් ලැබීම පිළිබඳවද ගැටළුවක්ව පවතී. මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රුඃ 10,663,260.00 ක අත්තිකාරම් මුදලක්ද ගෙවා ඇත. දැනට නිමකොට ඇති වැඩ කොටස් සඳහා වාර්තාවක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගැනීම සුදුසු වන අතර එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට අදාළව රට තුළ පවතින වත්මන් තත්ත්වය සැළකිල්ලට ගෙන රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛයේ 03 වගන්තියේ සඳහන් ආකාරයට දැනට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබුණද මෙතෙක් කටයුතු ආරම්භකර නොමැති ව්‍යාපෘතීන් තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම්දී ඇති හෙයින් එම චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව වර්තමානයේ රටෙහි පවතින වෙළඳපොළ මිළ විචලනය පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පවතින මිළ ගණන් අනුව ගෙවීම් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. එනමුත් ඒ සඳහා ප්‍රතිපාදන සළස්වා නොමැත. මේ වන විට රට තුළ පවතින වාතාවරණය අනුව මෙහි ඉදිකිරීම් සඳහා ඉල්ලා ඇති දේශීය ණය මුදල් ලැබීම පිළිබඳවද ගැටළුවක්ව පවතී. මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු: 10,663,260.00 ක අත්තිකාරම් මුදලක්ද ගෙවා ඇත. දැනට නිමකොට ඇති වැඩ කොටස් සඳහා වාර්තාවක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගැනීම සුදුසු වන අතර එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට අදාළව රට තුළ පවතින වත්මන් තත්ත්වය සැළකිල්ලට ගෙන රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛයේ 03 වගන්තියේ සඳහන් ආකාරයට දැනට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබුණද මෙතෙක් කටයුතු ආරම්භකර නොමැති ව්‍යාපෘතීන් තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම්දී ඇති හෙයින් එම චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යොජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට කළ යුතුයි කියන තැන මම ඉන්නවා. මෙහි නීත්‍යානුකූල පැත්ත පිළිබඳව අවධානය යොමු කර කෙසේ හෝ මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කළ යුතුයි යන්න මාගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, රජය යම් යම් චක්‍රලේඛ ගේනවා. නමුත් මුත් පළාත් පාලන ආයතන ස්වාධීන ආයතනයක්. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව කිසිම දවසක හෙරකම් කරලා විගණනයට ලක්වුණ ආයතනයක් නෙවෙයි. අපේ සභාව ඉතිරි කළ මුදල් වලින් තමයි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. රජයේ වැරදි ආර්ථික කළමනාකරණය නිසා රට බන්කොලොත් වුනාට අපේ සභාව එහෙම වෙලා නෑ. රටේ ආර්ථිකය පිළිබඳව සිතා නිකුත් කරන චක්‍රලේඛ වලින් අපේ අනාගත පරපුර වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති නැවැත්වීම සුදුසු නෑ. නිවැරදි ක්‍රමවේදයකට අනුව කටයුතු කරන ආයතනයක් විදිහට මොන චක්‍රලේඛ තිබුණත් කොන්ත්‍රාත්කරු එකඟ නම් මෙම ව්‍යාපාතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාමෙහි කිසිදු ගැටළුවක් නෑ.

ගරු සභාපතිතුමා

මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් ගෙවන ලද රු: 10,663,260.00 ක අත්තිකාරම් මුදලින් කොපමණ වැඩ කොටසක් නිම කර ඇතිදැයි කොන්ත්‍රාත්කරුගෙන් බිල්පත් ලබා ගැනීම සුදුසු බවත් වර්තමානයේ වෙළඳපොළ පවතින මිළ ගණන් වලට අනුව ව්‍යාපාතියේ ඉදිකිරීම් කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වන්නේනම් මෙම ව්‍යාපාතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාම සුදුසු බවත් ගරු මහා සභාවේ අදහස බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණයඃ-

ඒ අනුව කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් ගෙවන ලද රු: 10,663,260.00 ක අත්තිකාරම් මුදලින් කොපමණ වැඩ කොටසක් නිම කර ඇතිදැයි කොන්ත්‍රාත්කරුගෙන් බිල්පත් ලබා ගැනීම සුදුසු බවටත් වර්තමානයේ වෙළඳපොළ පවතින මිළ ගණන්

වලට අනුව ව්‍යාපාතියේ ඉදිකිරීම් කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වන්නේනම් මෙම ව්‍යාපාතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි.

05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 01ට අදාළව කඩ කාමර බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර්කරුවන් තෝරාගෙන ඇති අතර එම ටෙන්ඩර්කරුවන් විසින් සභාව වෙත ගෙවීමට එකඟතාවය පළ කරන ලද එක්වන් මුදල මේ වන විටත් සභාව වෙත ගෙවීමට පියවර ගෙන නොමැත. එම එක්වන් මුදලින් සංවර්ධනය කිරීමට යෝජනා ලද මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු කිරීමට වෙනත් මුදල් ප්‍රභවයක් නොමැත. රට තුළ පවතින වත්මන් තත්ත්වය සැළකිල්ලට ගෙන රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛයේ 03 වගන්තියේ සඳහන් ආකාරයට දැනට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබුණද මෙතෙක් කටයුතු ආරම්භකර නොමැති ව්‍යාපෘතීන් තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම්දී ඇත. ඒ අනුව මෙම වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජනා කරනු ලැබුවේ එක හිමියන් විසින් ගෙවනු ලබන එක්වන් මුදලිනි. එම ටෙන්ඩරකරුවන්ට මුදල් ගෙවන ලෙස දැන්වූවත් ඔවුන් මුදල් ගෙවුයේ නෑ. ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වුණා. එසේ තිබියදී රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට සිදුවන බැවින් ඒ සඳහා ගරු මහා සභාවේ එකඟතාවය මා බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති නිසා සහ මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නැවැත්වීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණයඃ-

ඒ අනුව උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 01ට අදාළව සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති නිසා සහ මුදල් අමාත්‍යංශය මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ:ව: 11.20ට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා සභා ගර්භයෙන් පිටව යන ලදි.

05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල උප කාර්යාලය සතියේ වැඩ කරන දින 05 අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ AM-04-11/ii-2022 සහ 2022.04.26 වන දිනැති ලිපිය අනුව 1988 ප්‍රාදේශීය සභා රීති වලට අනුකූලව උප කාර්යාලය පවත්වාගෙන යාම සඳහා නිළධාරීන් පත් කර ගැනීමට උපදෙස් ලබා දී ඇති බැවින් පහතින් සඳහන් කරන ලද නිලධාරීන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් යොදාගෙන ඇත්ගාල උප කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

- කාර්ය භාර නිලධාරි වශයෙන් - කළමනාකරණ සේවා නිලධාරි - 01
- සංවර්ධන නිලධාරි - 02
- තාක්ෂණ නිලධාරි - 01
- ආදායම් රැස්කිරීම සඳහා සංවර්ධන නිලධාරි - 01
- කාර්යාල කාර්ය සහායක - 01

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල උප කාර්යාලය සතියේ වැඩ කරන දින 05 අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා කාර්ය භාර නිලධාරි වශයෙන් - කළමනාකරණ සේවා නිලධාරි - 01ක්ද සංවර්ධන නිලධාරි - 02ක්ද තාක්ෂණ නිලධාරි - 01ක්ද ආදායම් රැස්කිරීම සඳහා සංවර්ධන නිලධාරි - 01 යොදවාගෙන එම කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල උප කාර්යාලය සතියේ වැඩ කරන දින 05 අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා කාර්ය භාර නිලධාරි වශයෙන් - කළමනාකරණ සේවා නිලධාරි - 01ක්ද සංවර්ධන නිලධාරි - 02ක්ද තාක්ෂණ නිලධාරි - 01ක්ද ආදායම් රැස්කිරීම සඳහා සංවර්ධන නිලධාරි - 01 යොදවාගෙන එම කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:02 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගම්පොළවෙල හා මාළිගාපුරණ ගම් වලට පිවිසෙන පාලම කැඩීගොස් දැනට වසර 04 කට ආසන්න කාලයක් වන අතර මෙම ප්‍රදේශවල ජීවත්වන පවුල් 2000ක් 2500ක් අතර ජනතාව විශාල දුර ප්‍රමාණයක් ගෙවා ගම්පොළ නගරයට පිවිසීමට

සිදුවී ඇත. මෙය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් පාලමක් වන අතර ජනතාවට පයින් ගමන් කිරීමට අතුරු පාලමක් සාදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. නිලාම් මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

ගම්පොළවෙල හා මාළිගාපුරණ ගම් වලට පිවිසෙන පාලම කැඩීගොස් දැනට වසර 04 කට ආසන්න කාලයක් වන අතර මෙම ප්‍රදේශවල ජීවත්වන පවුල් 2000ක් 2500ක් අතර ජනතාව විශාල දුර ප්‍රමාණයක් ගෙවා ගම්පොළ නගරයට පිවිසීමට සිදුවී ඇත. ගම්පොළ නගරයේ සිට ගම්පොළ මාළිගාපුරණ හරහා ජයමාලපුර දක්වා ගමන්කරන මිනිසුන්ට පයින්වත් ගමන් කරගන්න විදිහක් නෑ. මෙම පාලම කැඩෙන්න පෙරත් එහි නාය යාමේ අවධානමක් තිබෙන බව ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කළා. ඒ වෙලාවේ පොරොන්දු වුවත් කිසිම කෙනෙකු එය හදලා දෙන්න උනන්දු වුණේ නෑ. එහෙත් මම අපේ ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා කළ උදවු වලට. මහා මාර්ග ඇමතිවරු පත් වුණත් ඇස්තමේන්තු හැදුවත් එය ක්‍රියාත්මක කළේ නෑ. විටින් විට ඡන්ද පැවැත්වුණා. අපි බලාපොරොත්තු වුණා පත්වෙන නායකයින් අපේ ගමට යන මාර්ගය හදලා දෙයි කියලා. එහෙත් කිසිවෙකු ඒ පිළිබඳව ඉදිරිපත් වුණේ නෑ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා කඩාවැටී තිබෙණ පාලමෙන් ද්‍රව්‍ය යොදාගෙන හෝ පයින් ගමන් කළ හැකි ආකාරයට මෙම පාලම සාදා දෙන ලෙස ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ගැටළුව ඉතාම සංවේදි. දැනට තාවකාලිකව හෝ ආරක්‍ෂා සහිතව පාලමක් සාදා ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කර දෙනවා. අදම තාක්‍ෂණ නිලධාරී මහතා එම ස්ථානයට යොමු කර තාක්‍ෂණ වාර්තාවක් ලබාගෙන ඇස්තමේන්තුව සකස් කර පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව ගරු මහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව තාක්‍ෂණ නිලධාරි මහතා එම ස්ථානයට යොමු කර එම තාක්‍ෂන නිලධරි වාර්තාවට අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ත්‍රී රෝද රථයක් ධාවනය කිරීමට හැකි වන පරිදි සභා අරමුදල් යොදවා තාවකාලික පාලමක් ඉදිකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි.

## 06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

### 06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ 2020 හා 2021 වර්ෂ සඳහා ද්‍රව්‍ය මිලදී ගැනිමට රුපියල් එකොළොස් ලක්‍ෂ හැත්තෑපන්දහසක ( රු: 1,175,000.00 ) මුදලක් වෙන් කර ණයගිම් කර ඇත. මෙම ද්‍රව්‍ය මිලදී ගැනිමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතුද සිදු කර ඇත. නමුත් පසුගිය කාල සීමාවේ රට තුළ පැවැති කොරෝනා වසංගතය නිසා සහ වෙළෙඳපොළ භාණ්ඩ මිළ අස්ථාවර විම නිසා වෙන්කරන ලද මුදලින් යෝජිත ද්‍රව්‍ය මිළදී ගැනිම විගණන ගැටළු වලට හේතුවන නිසාත් , මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයෙන් ලබාදි ඇති උපදෙස් පරිදි ද්‍රව්‍ය මිලදී ගැනිම නතර කිරීමට සිදුව ඇති නිසාත් 2020 හා 2021 වර්ෂවල ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා වෙන්කරන ලද රුපියල් එකොළොස් ලක්‍ෂ හැත්තෑපන්දහසක මුදල සභා අරමුදලට බැර කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ 2020 හා 2021 වර්ෂ සඳහා ද්‍රව්‍ය මිලදී ගැනිමට රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑපන්දහසක ( රුː 1,175,000.00 ) මුදලක් වෙන් කර ණයගිමි කර ඇත. මෙම ද්‍රව්‍ය මිලදී ගැනිමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතුද සිදු කළ නමුත් පසුගිය කාල සීමාවේ රට තුළ පැවැති කොරෝනා වසංගතය නිසා සහ වෙළෙඳපොළ භාණ්ඩ මිළ අස්ථාවර විම නිසා වෙන්කරන ලද මුදලින් යෝජිත ද්‍රව්‍ය මිළදී ගැනිම විගණන ගැටළු වලට හේතුවන නිසාත්, මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් පරිදි ද්‍රව්‍ය මිලදී ගැනිම නතර කිරිමට සිදුව ඇති නිසාත් 2020 හා 2021 වර්ෂවල ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා වෙන්කරන ලද රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑපන්දහසක මුදල සභා අරමුදලට බැර කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමා, 2020,2021 වර්ෂ වලට අදාළ ද්‍රව්‍ය මිලදී ගැනිමට අනුව අප සභාවෙන් සියලු කටයුතු සිදු කළා. එහෙත් මෙය අනෙක් රාජ්‍ය ආයතන වලදී විය යුතු කටයුතු නිසි ආකාරයට සිද්ධ වුණේ නෑ. ඒ නිසා තමයි අපිට මෙම ද්‍රව්‍ය මිළදී ගැනීමට අවස්ථාවක් නොවුණේ. ඒ පිළිබඳව මම කණගාටු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, මෙම මිළදී ගැනීම් වලට අනුමැතිය ලබා ගැනීමට අපි වෙහෙස වුණා. එහෙත් අප පළාත් පාලන ආයතනය අනෙක් පළාත් පාලන ආයතන වගේ විගණනයට ලක් වුණ ආයතනයක් නෙවෙයි. අඩුම දෙන්න පුළුවන් ද්‍රව්‍ය ටික වත් බෙදන්න අනුමැතිය ලබා දෙන්න තිබුණා. එහෙත් ඉහළ රාජ්‍ය නිලධාරීන් ඒ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගන්නේ නෑ. අද මේ රට පත්වෙලා තියන තත්ත්වයට දේශපාලඥයා 50%ක් වගකිව යුතු නම් 50%ක් ඉහළ ඉන්න රාජ්‍ය නිලධාරීන් වගකිව යුතු බව මම හැමදාම කියන දෙයක් තමයි. එවැනි තත්ත්වයක් තුළ ගම්වලට ජෙනරේටරය, පුටුව අරන් දෙන්න ගමේ මන්ත්‍රීවරයට නොහැකි වෙලා තියෙනවා. කාගෙද වරද. ඉහළ සිට පහළ රාජ්‍ය නිලධාරීන් මේවට වගකිව යුතුයි. අද දේශපාලඥයාට පාරෙ බැහැලා යන්න බැරිවෙලා තියෙනවා. ඒ තත්ත්වය ඇතිවීමට ඉහළ ඉන්න පුටු රත් කරන රාජ්‍ය නිලධාරීන්ද වගකිව යුතුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණයː-

ඒ අනුව 2020 හා 2021 වර්ෂවල ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා වෙන්කරන ලද රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑපන්දහසක මුදල සභා අරමුදලට බැර කිරිම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් රථ සඳහා 11-28 ප්‍රමාණයේ ටයර් සඳහා මිළ ගණන් කැඳවන ලදි. එම මිළ ගණන් කැඳවීමට අනුව MJR පීරිස් - මහනුවර, සුපිරි ටයර් හවුස් - මහනුවර සහ කොළඹ ටයර් - ගම්පොළ යන ආයතන තුනෙන් මිළ ගණන් ඉදිරිපත් කරන ලදි. 2022.03.28 වන දින මිළ ගණන් විවෘත කළ අතර එහිදී තාක්‍ෂණ කමිටු නිර්දේශය අනුව MJR පීරිස් ආයතනයෙන් PR - 12 එක් ටයරයක මිළ රුः 80,503.20 ක් වන පරිදි ටයර් 04ක් මිළට ගැනීමට නිර්දේශ කරන ලදි. ඊට අදාළ ඇණවුම් සකස් කර MJR පීරිස් ආයතනයට යොමු කළ අතර එහිදී වත්මන් මිළ ගණන් අනුව මුලින් ඉදිරිපත් කළ මිළට අදාළ ටයර් මිළදී ගත නොහැකි බව එම ආයතනය මගින් දන්වා ඇත. අප සභාවේ අවශ්‍යතාවය සළකා වත්මන් මිළ ගණන් වන එක් ටයරයක මිළ රුः 103,690.80 බැගින් ටයර් 04ක් MJR පීරිස් ආයතනයෙන් මිළදී ගැනීමට හැකි බව එම ආයතනයෙන් දන්වා ඇත. එහෙත් කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් අදාළ ටයරය රුः 103,500.00ක මිළට ලබා ගත හැකි නමුත් එම ආයතනය අප සභාවේ සැපයුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි ආයතනයක් නොවූවත් , එම ආයතනයෙන් ටයර් මිළදී ගන්නේ නම් ප්‍රවාහන වියදමද අඩු කර ගැනීමට හැකිය. එම නිසා කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් එක් ටයරයක් රුः 103,500.00 බැගින් ටයර් 04ක් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් රථ සඳහා 11-28 ප්‍රමාණයේ ටයර් සඳහා මිළ ගණන් කැඳවන ලදි. එම මිළ ගණන් කැඳවීමට අනුව MJR පීරිස් - මහනුවර, සුපිරි ටයර් හවුස් - මහනුවර සහ කොළඹ ටයර් - ගම්පොළ යන ආයතන තුනෙන් මිළ ගණන් ඉදිරිපත් කරන ලදි. 2022.03.28 වන දින මිළ ගණන් විවෘත කළ අතර එහිදී තාක්‍ෂණ කමිටු නිර්දේශය අනුව MJR පීරිස් ආයතනයෙන් PR - 12 එක් ටයරයක මිළ රුः 80,503.20 ක් වන පරිදි ටයර් 04ක් මිළට ගැනීමට නිර්දේශ කරන ලදි. ඊට අදාළ ඇණවුම් සකස් කර MJR පීරිස් ආයතනයට යොමු කළ අතර එහිදී වත්මන් මිළ ගණන් අනුව මුලින් ඉදිරිපත් කළ මිළට අදාළ ටයර් මිළදී ගත නොහැකි බව එම ආයතනය මගින් දන්වා ඇත. අප සභාවේ අවශ්‍යතාවය සළකා වත්මන් මිළ ගණන් වන එක් ටයරයක මිළ රුः 103,690.80 බැගින් ටයර් 04ක් MJR පීරිස් ආයතනයෙන් මිළදී ගැනීමට හැකි බව එම ආයතනයෙන් දන්වා ඇත. එහෙත් කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් අදාළ ටයරය රුः 103,500.00ක මිළට ලබා ගත හැකි නමුත් එම ආයතනය අප සභාවේ සැපයුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි ආයතනයක් නොවූවත් , එම ආයතනයෙන් ටයර් මිළදී ගන්නේ නම් ප්‍රවාහන වියදමද අඩු කර ගැනීමට හැකිය. එම නිසා කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් එක් ටයරයක් රුः 103,500.00 බැගින් ටයර් 04ක් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, ප්‍රවාහන වියදමද අඩු කර ගැනීමට හැකි වන නිසා කොළඹ ටයර් - ගම්පොළ ආයතනයෙන් එක් ටයරයක් රුः 103,500.00 බැගින් ටයර් 04ක් මිළදී ගැනීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් රථ සඳහා 11-28 ප්‍රමාණයේ ටයර් මිළදී ගැනීමට කොළඹ ටයර් - ගම්පොළ ආයතනය මගින් එක් ටයරයක් රුः 103,500.00 බැගින් ටයර් 04ක් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා නැවත ආරම්භ කිරීම සඳහා උපදේශකවරයෙකු සතියකට දින දෙකක් පැමිණීමට එකඟතාවය පළ කර ඇත. එක් දිනකට රුः 2000.00 බැගින් වන දීමනාවකට යටත්ව එම උපදේශකවරයා තම සේවාව දරුවන් වෙත ලබාදෙන බැවින් 2022 ජූලි මස 01 වන දින සිට සතියේ සෑම බදාදා සහ සිකුරාදා දින දෙක තුළ පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා නැවත ආරම්භ කිරීම සඳහා උපදේශකවරයෙකු සතියකට දින දෙකක් පැමිණීමට එකඟතාවය පළ කර ඇත. ගම්පොළ නගර සභාවේ ඊනැණ පියස පරිගණක පුහුණුව ලබාදෙන්නේ මෙම උපදේශකවරයායි. එක් දිනකට රුः 2000.00 බැගින් වන දීමනාවකට යටත්ව එම උපදේශකවරයා තම සේවාව දරුවන් වෙත ලබාදෙන බැවින් 2022 ජූලි මස 01 වන දින සිට සතියේ සෑම බදාදා සහ සිකුරාදා දින දෙක තුළ පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ 2022 ජූලි මස 01 වන දින සිට සතියේ සෑම බදාදා සහ සිකුරාදා දින දෙක තුළ පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවටත් ඒ සඳහා සහභාගී වන උපදේශකවරයාට එක් දිනකට රුः 2000.00ක දෛනික දීමනාවක් ගෙවීමේ පදනම මත පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07. කාරක සභා වාර්තා සළකා බැලීම

### 01.මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

2022.05.17 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 අප්‍රේල් මස මුළු ලැබීම් රුː9,426,667.83 ක්ද මුළු වියදම රුː10,996,000.54 ක්ද විය. 2022 මාර්තු මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයද 2022.05.17 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.05.09 සිට 2022.05.18වනදින දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 5/9/2022 | ගරු සභාපති පී.ඕ.පී.ඩී.එන්.බී. ජයසේකර මහතා | බල ප්‍රදේශයෙන් බැහැර රාජකාරි සඳහා ගෙවීම් කිරිම | 510 | | 11,000.00 |
| 2 | | එන්.පී.එස්.එස්.සෝමතිලක මයා - රියදුරු | 2022 අප්‍රේල් මස බල ප්‍රදේශයෙන් බැහැර රාජකාරි වෙනුවෙන් සංයුක්ත දීමනාව ගෙවීම. | 511 | | 7,000.00 |
| 3 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ කසල මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරු 05 දෙනෙකු සඳහා 2022 අප්‍රේල් මස වැටුප් ගෙවීම. | 512 | 25.00 | 106,123.95 |
| 4 | | එන්.පී.එස්.එස්.සෝමතිලක මයා - රියදුරු | 2022 - අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම (පැය 125) | 513 | | 13,993.75 |
| 5 | 5/13/2022 | ආර්.එම්.ඉනෝකා සෙනෙවිරත්න මිය- මැහුම් උපදේශිකා | 2022 අප්‍රේල් මාසයේ වැටකේදෙණිය විහාරස්ථාන ධර්ම ශාලාවේ 2022/04/05,19,22 සහ 26 දිනවලදි පැවැත් වූ මැහුම් පාඨමාලාව සඳහා ගෙවීම් කිරිම | 514 | | 8,000.00 |
| 6 | | මියනගොල්ල පැරකුම් ගොවි සමිතිය- දොළොස්බාගේ | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද මියනගොල්ල විහාරස්ථානය අසලින් යන මාර්ගය සංවර්ධනය කිරිම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 515 | 13,797.95 | 102,173.43 |
| 7 | | සමගි ප්‍රජා මුල සංවිධානය | කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ 2022 අප්‍රේල් මස ජලය ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 516 | | 120.00 |
| 8 | 5/17/2022 | පී.පී.එස්.ජේ කිත්සිරි මයා - පරිසර නිලධාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 මාර්තු | 517 | | 4,559.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9 | | මෛත්‍රිලතා අභයරත්න මිය- පුස්තකාලයාධිපති | 2022.04.29 දින පවත්වන ලද කුරුඳුවත්ත මහජන පුස්තකාල උපදේශන කමිටුවට සහභාගි වූ අය වෙනුවෙන් පැවැත් වූ තේ පැන් සංග්‍රහය සඳහා අතින් වියදම් වූ මුදල් ගෙවීම. | 518 | | **610.00** |
| 10 | | ඩබ්ලිව් ජනජීව මයා - සංවර්ධන නිලධාරි | **CPLL 7322** ජල බවුසරයේ ආදායම් බලපත්‍රය ලබාගැනිම සඳහා (2022.05.19 දින සිට 2023.05.18 දක්වා) අත්තිකාරම් මුදල් ගෙවීම. | 519 | | **10,000.00** |
| 11 | | කේ.පි ක්‍රිශාන්ත සමන්සිරි මයා - මාර්ග කම්කරු | 2022 - අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම ( පැය 50 ) | 520 | | **5,260.00** |
| 12 | | බී.පි.මිල්ටන්රත්න මයා - මාර්ග කම්කරු | 2022 - අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම (පැය 46 වි 37) | 521 | | **4,903.95** |
| 13 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | ඇත්ගාල මහජන පුස්තකාලයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.03.17 සිට 2023.03.17 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 522 | | **17,311.99** |
| 14 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | කුරුඳුවත්ත ආයුර්වේද ගොඩනැගිල්ලේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.04.05 සිට 2023.04.05 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 523 | | **1,572.24** |
| 15 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.04.05 සිට 2023.04.05 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 524 | | **1,193.08** |
| 16 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | උලපනේ ජංගම කාර්යාලයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.04.09 සිට 2023.04.09 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 525 | | **1,193.08** |
| 17 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.04.09 සිට 2023.04.09 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 526 | | **23,785.07** |
| 18 | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම, ගඟසිරි පාර, ගම්පොළ | ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් (2022.04.09 සිට 2023.04.09 දක්වා) රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 527 | | **14,367.41** |
| 19 | | ගොඩකුඹුර කොමියුනිකේෂන්- කුරුඳුවත්ත | කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ 2022 අප්‍රේල් මස පුවත්පත් මිලදී ගැනිම වෙනුවෙන් ගෙවිය යුතු මුදල, හිඟ කඩකුලි සඳහා හිලව් කිරිම | 528 | | **3,790.00** |
| 20 | | ABC ඔටෝ සර්විස් සෙන්ටර් , උලපනේ | **CPRW-6917** ට්‍රැක්ටර් ට්‍රේලරයේ ටිපර් ජැක් එක අලුතින් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 529 | **25.00** | **48,725.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | | විතානගේ එන්ට්‍රප්‍රයිසස් , මහනුවර | 2021 භාණ්ඩ වෙන්දේසියෙන් ලබාගත් මුදලින් ඇදි සහිත ප්ලාස්ටික් පුටු ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 530 | 25.00 | 60,031.64 |
| 22 | 5/18/2021 | සී.කේ.ගාර්ධි පුංචිහේවා මෙය- කළමනාකරණ සේවා නිලධාරි | නිවසේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය ගෙවීම. | 531 | 25.00 | 249,975.00 |
| 23 | | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දේශිය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව- කොළඹ 02 | 2022 වර්ෂයේ පළමු කාර්තුවේ රුපියල් 25 මුද්දර ගාස්තු හා 10% මුද්දර බදු දේශිය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ගෙවීම. | 532 | | 24,025.00 |
| 24 | | සුනිල් විජේතුංග මයා, කුරුඳුවත්ත | 2021/12/10 දින අනතුරුදායක පොල් ගසක් හා කිතුල් ගසක් කපා ඉවත් කිරිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 533 | | 10,000.00 |
| 25 | | එස්.ටී.කුමාරසිංහ මයා, කුරුඳුවත්ත | කාර්යාලයේ භාවිතා කරන විදුලි කේතලය අළුත්වැඩියා කිරිමේ ගාස්තු ගෙවීම. | 534 | | 1,800.00 |
| 26 | | පී.පී.එස්.පේ කිත්සිරි මයා - පරිසර නිලධාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 අප්‍රේල් | 535 | | 4,700.00 |
| 27 | | ඩබ්.ජේ.පී.ගුණරත්න මයා ආදායම් පරීක්ෂක | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 අප්‍රේල් | 536 | | 3,926.00 |
| 28 | | බී.පී.ටී.දිසානායක මයා- සංවර්ධන නිලධාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 අප්‍රේල් | 537 | | 4,700.00 |
| 29 | | එම්.පී.සිසිර කුමාර මයා - වැඩ මූලික | 2022 - අප්‍රේල් මස අතිකාල දිමනා ගෙවීම ( පැය 27 ) | 538 | | 2,810.40 |
| 30 | | එම්.පී.සිසිර කුමාර මයා - වැඩ මූලික | 2023 - මාර්තු මස අතිකාල දිමනා ගෙවීම (පැය 40 ) | 539 | | 4,208.00 |
| 31 | | පී.හේමමාලා මිය - කළමනාකරණ සේවා නිලධාරි | කුරුඳුවත්ත මහජන ක්‍රිඩාංගනයේ තණකොළ කපන අත් ට්‍රැක්ටරයේ තලය කැඩියාම නිසා අළුතින් තලයක් ගැනීමට අතින් වියදම් වූ මුදල් ලබා ගැනිම. | 540 | | 3,030.00 |
| 32 | | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි- කුරුඳුවත්ත | 2022 වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා ගඟ ඉහළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ ආහාර නියැදි මිලදී ගැනීම වෙනුවෙන් වැය කළ මුදල ගෙවීම. | 541 | | 5,957.00 |
| 33 | | සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුඳුවත්ත | 2022 අප්‍රේල් 01 දින සිට 2022 අප්‍රේල් 11 දින දක්වා ණය පදනම මත ලබාගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම. ( මීට අදාල විස්තර අමුණා ඇත ) | 542 | | 144,387.30 |
| | | එකතුව | | | 13,897.95 | 905,232.29 |

**09. වෙනත්**

**01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.**

**නිවාඩු අනුමත කරන ලදි.**

**02. සමර්සෙට් කොවිඩ් මධ්‍යස්ථානයට ජල බවුසරය යොදවා ජලය ගෙන යාමට අදාළව ඉන්ධන වියදම් වාර්තාව සභාගත කරන ලදි.**

**ගරු සභිකවරුන්ගේ ඉල්ලීම අනුව ධාවන සටහන් පරීක්ෂා කිරීමට මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදි.**

**ගරු සභාපතිතුමා**

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වනබව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙනයාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.30 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022.05.24 වනදින ගඟ ඉහළ කෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදීය